සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

**Provincial Department of Education - NWP**

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

**දෙවන වාර පරීක්ෂණය - 2025**

**Second Term Test - 2025**

| 6 ශ්‍රේණිය | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | කාලය පැය 01 යි. මි. 30 |
|---|---|---|

නම/ විභාග අංකය:


- **සියලුම ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු සපයන්න.**
- **අංක 01 සිට 05 දක්වා ප්‍රශ්න සඳහා වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(01) (i) පරිගණකය ක්‍රියාත්මකව පවතින විට දත්ත, තොරතුරු හා උපදෙස් තාවකාලිකව රඳවා ගන්නා උපාංගය කුමක් ද?

(1) මධ්‍ය සැකසුම් ඒකකය (2) සසම්භාවී ප්‍රවේශ මතකය

(3) අභ්‍යන්තර දෘඪ තැටිය (4) පද්ධති ඒකකය

(ii) පහත දැක්වෙන උපාංගය .......................... උපක්‍රමයකි.



(1) ආදාන

(2) ප්‍රතිදාන


(3) ආචයන

(4) සන්නිවේදන

(iii) යතුරු පුවරුවේ වචන අතර එක් පරතරයක් තැබීම සඳහා යොදා ගන්නා යතුර කුමක් ද?

(1) Tab (2) Enter (3) Space Bar (4) Backspace

(iv) රූපයේ සඳහන් වැඩ කවුළුවේ දැක්වෙන මෙවලම් 3 අනුපිළිවලින් දැක්වෙන පිළිතුර වන්නේ,



(1) Minimize, Maximize, Close

(2) Close, Minimize, Maximize


(3) Close, Maximize, Minimize

(4) Close, Maximize, Restore

(v) ෂෙහාන් තම පරිගණකයට ශක්තිමත් මුරපදයක් දැමීමට අදහස් කරයි. පහත මුරපද අතරින් ඒ සඳහා ගැලපෙන මුරපදය වන්නේ,

(1) 12345 (2) Sa#an123@ (3) 2222sadfgi (4) 23@#@#$!

(02) (A) පහත සඳහන් ගොනු බහලුම් (folder) වලට සුදුසු ගොනු (Files) තෝරා යා කරන්න.



(B) පහත සඳහන් ගොනුවේ, ගොනු නාමය හා ගොනු දිගුව වෙන් වෙන්ව ලියා දක්වන්න.

**ගොනුව:**




**Kamal.docx**

ගොනුවේ නම : ................................... ගොනු දිගුව : ...................................

(03) පහත සඳහන් වාක්‍ය වැරදි නම් (✗) ලකුණ ද නිවැරදි නම් (✓) ලකුණ ද යොදන්න.

(i) පරිගණක භාවිත කරමින් යම් කාර්යයක් ඉටුකර ගැනීම සඳහා සකස් කර ඇති පරිගණක වැඩසටහන් මෘදුකාංග වේ. (........)

(ii) රොබෝ තාක්ෂණය කර්මාන්තශාලා තුල යොදා ගැනීම නිසා මිනිස් ශ්‍රමය වැඩි වශයෙන් යොදා ගැනීමට සිදුවී ඇත. (........)

(iii) දැනට භාවිතා කරන උපකරණ නිවැරදිව නඩත්තු කරමින් දිගු කාලයක් භාවිතයට ගැනීම ප්‍රතිචක්‍රීකරණය වේ. (........)

(iv) පරිගණක වසා දැමීමේ (Shut down) විධානය තෝරා ක්ලික් (Click) කිරීමට පෙර නිර්බාධක ජව සැපයුම (UPS) ක්‍රියා විරහිත කල යුතුය. (........)

(v) පරිගණකය ක්‍රියාත්මක කල වහාම සංදර්ශක තිරයේ පරිශීලක අතුරු මුහුණත (user interface) පෙන්නුම් කරනු ලැබේ. (........)

(04) හිස්තැනට සුදුසු වචනය වරහන තුලින් තෝරා හිස්තැන් පුරවන්න.

(i) ................................... යනු චිත්‍රක මෘදුකාංගයක් වේ.

(Adobe Illustrator / Adobe Audition)

(ii) පරිශීලක අවශ්‍යතා සපුරාගැනීමට සකසා ඇති මෘදුකාංග ................................... වේ.

(පද්ධති මෘදුකාංග / යෙදුම් මෘදුකාංග)

(iii) පරිගණකයේ ලාක්ෂණික ගුණාංගයක් ලෙස ................................... සැළකිය හැකිය.

(නිරවද්‍යතාව / වෙහෙසකර බව)

(iv) පරිශීලකයා හා පරිගණක දෘඩාංග අතර සම්බන්ධතාව ................................... මගින් ඇති කරනු ලබයි.

(මධ්‍ය සැකසුම් ඒකකය / මෙහෙයුම් පද්ධතිය)

(v) ................................... නිහිත පරිගණක සහිත උපකරණයකි.

(ස්මාට් ඔරලෝසුව / ඇබරුම් යන්ත්‍රය) ..................................

(05) කෙටි පිළිතුරු ලියන්න.

(i) පරිගණකයේ මූලික කාර්යය ලියා දක්වන්න.

| ...................... | → | ...................... | → | ...................... |
|---|---|---|---|---|

(ii) පරිගණකයේ සන්නිවේදන උපක්‍රම 2 ක් සහ ආචයන උපක්‍රම 02 ක් ලියන්න.

(a) සන්නිවේදන උපක්‍රම :-

.............................................................................................................................

.............................................................................................................................

(b) ආචයන උපක්‍රම :-

.............................................................................................................................

.............................................................................................................................

(iii) මූසිකය භාවිතයෙන් පරිගණක තිරය මත සිදු කල හැකි කාර්යන් 02 ක් නම් කරන්න.

.............................................................................................................................

.............................................................................................................................

(iv) ඔබ දන්නා යෙදුම් මෘදුකාංග 02 ක් නම් කරන්න.

.............................................................................................................................

.............................................................................................................................

(v) පහත දැක්වෙන මෙහෙයුම් පද්ධති හඳුනාගෙන නම් කරන්න.



a) ---------------------- b)---------------------- c) ----------------------

(vi) පාසල හා රෝහල තුළ පරිගණක පද්ධති භාවිත වන අවස්ථා එක බැගින් ලියන්න.

(a) පාසල :-

........................................................................................................................

........................................................................................................................

(b) රෝහල :-

........................................................................................................................

........................................................................................................................

(vii) පහත දැක්වෙනුයේ කමල් අසුන්ගතව තම පරිගණකය භාවිත කරන ආකාරයයි. මෙහි දැක්වෙන වැරදි ඉරියව් 03 ක් නම් කරන්න.



........................................................................................................................

........................................................................................................................

........................................................................................................................

(viii) පරිගණක විද්‍යාගාරය ආරක්ෂිතව පරිහරණය කිරීමේදී උපාංග වල ආරක්ෂාවට අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග 02 ක් ලියන්න.

........................................................................................................................

........................................................................................................................


**පිළිතුරු පත්‍රය**

(01) (i) (2) සසම්භාවී ප්‍රවේශ මතකය (ii) (2) ප්‍රතිදාන

(iii) (3) Space Bar (iv) (1) Minimize, Maximize, Close

(v) (2) Sa#an123@ (ල. 3 x 5 = 15)

(02) (A)




(ල. 3 x 4 = 12)

(B) ගොනුවේ නම Kamal

ගොනුවේ දිගුව docx

(ල. 1.5 x 2 = 03)

(03) (i) (✓) (ii) (✗) (iii) (✗) (iv) (✗) (v) (✓)

(ල. 3 x 5 = 15)

(04) (i) Adobe Illustrator (ii) යෙදුම් මෘදුකාංග (iii) නිරවද්‍යතාව

(iv) මෙහෙයුම් පද්ධතිය (v) ස්මාට් ඔරලෝසුව (ල. 3 x 5 = 15)

(05) (i) ආදානය, සැකසීම, ප්‍රතිදානය (ල. 03)

(ii) (a) සන්නිවේදන උපක්‍රම :- මොඩමය, ජාලකරණ කාඩ්පත

(b) ආචයන උපක්‍රම :- දෘඪ තැටිය, පෙන්ඩ්‍රයිවය/ සැණෙලි ධාවකය (ල. 08)
හෝ ගැලපෙන පිළිතුරක්

(iii) අවශ්‍ය දේ තේරීම / අවශ්‍ය දේ විවෘත කිරීම / අවශ්‍ය දේ එහා මෙහා ගෙනයාම (move) හෝ ගැළපෙන පිළිතුරක් (ල. 04)

(iv) Microsoft Word / Microsoft Power point හෝ ගැලපෙන පිළිතුරක් (ල. 04)

(v) (a) Ubuntu (b) Android (c) Mac os (ල. 06)

(vi) (a) පාසල :- සිසුන්ගේ ලකුණු වාර්තා කිරීම හා ගබඩා කිරීම.

(b) රෝහල :- රෝගීන්ගේ තොරතුරු හා වෛද්‍ය වාර්තා ගබඩා කිරීම හෝ ගැලපෙන පිළිතුරක්

(ල. 06)

(vii) 1. කොන්ද කෙලින් ආධාරකයට හේත්තු වන සේ තබා නොගැනීම.

2. මොනිටරයට ඉතා ළඟින් සිටීම.

3. අත් නිසි ඉරියව්වෙන් නොතැබීම. (ල. 06)

(viii) 1. පරිගණක විද්‍යාගාරය තුළ ආහාරපාන ගැනීමෙන් වැළකීම.

2. පරිගණක උපාංග නිසි ලෙස ක්‍රියාවිරහිත කිරීම හා නිවා දැමීම. හෝ ගැලපෙන පිළිතුරක්

(ල. 1.5 x 2 = 03)